# හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ කෘෂිකාර්මික දත්ත බැංකුව

1972 අංක 5 දරන ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය පිහිටුවීමේ පනතෙහි අංක 3.1 (ඌ) වගන්තියේ සඳහන් පරිදි ආයතනයේ ප්‍රධාන කාර්යයක් වන්නේ "තොරතුරු එක්රැස් කිරීම සහ සැපයීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාමයි". මේ අරමුණ ඉටු කර ගැනීමේ මූලික පියවරක් ලෙස සාමාන්‍ය වශයෙන් හෝ විශේෂ පදනමක් මත හෝ රැස් කර ඇති දත්තවල ස්වභාවය පිළිබඳව ගොවි කටයුතු හා ඊට අදළ සමාජ - ආර්ථික කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාකරන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතනවලින් 1974 මාසයේ දී තොරතුරු විමසන ලදි.

ඒ අනුව ලබා ගන්නා ලද තොරතුරු පදනම් කොට ගෙන අනෙකුත් ආයතනවල ඇති දත්තවල ස්වභාවය පිළිබඳව මූලික තොරතුරු රැස් කිරීමේ කාර්යය 1975 සිට ආරම්භ කරන ලදි.

ප්‍රධාන අංග 10කින් සමන්විත වන පරිදි දත්ත බැංකුව සැලසුම් කරන ලද අතර ගොවි කටයුතු ක්ෂේත්‍රය හා අදළ කරුණු පිළිබඳ තොරතුරු ඇතුළත් වන පරිදි 8"×4 1/2" කාඩ් පත් හි දත්ත රැස් කර ඒවා කරකැවිය හැකි කැබිනෙට්ටුවක (Rotary Cabinet) තැන්පත් කිරීම 1976 දී සිදු කරනු ලැබිය.

විධිමත් ආකාරයෙන් මේ කාර්යය පවත්වාගෙන යාම වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ සහයෝගය ඇතිව 1979 දී තොරතුරු මධ්‍යස්ථාන ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදි.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදළ තොරතුරු, දත්ත පරිහරණය කරන්නන් හට පහසුවෙන් ලබා ගත හැකි වන පරිදි එකම ස්ථානයක තැන්පත් කර ඒවා ලබාදීමේ අරමුණ ඇතිව 1983 දී පරිගණක ගත කරන ලද කෘෂිකාර්මික දත්ත බැංකුව ස්ථාපිත කරනු ලැබිය.

කෘෂිකර්ම ක්ෂේත්‍රයේ විවිධ පැතිකඩ ආවරණය වන ආකාරයට පහත සඳහන් රාජ්‍ය දෙපාර්තමේන්තු සහ ආයතන විසින් එක් රැස් කරනු ලබන ද්විතීයික දත්ත මෙහි අඩංගු වේ.

1. ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව.
2. ශ්‍රී ලංකා මහ බැංකුව
3. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
4. ශ්‍රී ලංකා රේගුව
5. ජාතික පොහොර ලේකම් කාර්යාලය
6. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
7. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
8. වෙනත් අදළ දෙපාර්තමේන්තු හා ආයතන

ඉහත සඳහන් දෙපාර්තමේන්තු බොහොමයක් වෙන් වෙන් වශයෙන් තමන්ගේ වෙබ් අඩවි පවත්වාගෙන යනු ලබන අතර බොහෝ විට ඒවායේ අඩංගු වන්නේ ඉතාමත් ආසන්න වර්ෂයට හෝ දෙකකට අයත් සමහර තොරතුරු පමණි. එසේ වුව ද, මෙම ආයතනයේ දත්ත බැංකුවෙහි අඩුම වශයෙන් අවුරුදු 25 ක් දක්වා තොරතුරු දිස්ත්‍රික මට්ටමින් සහ ජාතික මට්ටමින් ඇතුළත් කර තිබේ. එබැවින්, කාල ශ්‍රේණි විශ්ලේෂණ කටයුතුවල දී මේ දත්ත බැංකුව පරිහරණය කිරීම ඉතාමත් වැඩදයි වේ.

ඉහත සඳහන් ආයතනයන් විසින් එකතු කර නිකුත් කරන්නා වූ පහත සඳහන් තොරතුරු දත්ත බැංකුවේ තැන්පත් කොට ඇත.

විවිධ භෝගයන්ට අදාළ තොරතුරු

- වගා කරන ලද බිම් ප්‍රමාණයන්
- නිෂ්පාදන ප්‍රමාණයන් (කන්න වශයෙන් අදළ වන පරිදි)
- නිෂ්පාදන, තොග සහ සිල්ලර මිල ගණන්
- නිෂ්පාදන පිරිවැය
- ආනයන සහ අපනයන ප්‍රමාණයන්
- පොහොර භාවිතය
- ඒකපුද්ගල පරිභෝජන ප්‍රමාණයන්
- භෝගයන් සම්බන්ධ වෙනත් තොරතුරු

මෙයට අමතරව කෘෂිකාර්මික දත්ත බැංකු මගින් පහත සඳහන් ප්‍රධාන මාතෘකා යටතේ විවිධ තොරතුරු එක් රැස් කර ඇත.

- සේවා නියුක්තිය
- ගොවි කාරකයින්
- ඉඩම් භාවිතය/භුක්තිය
- කෘෂි යන්ත්‍රෝපකරණ
- පොහොර භාවිතය
- කෘෂි රසායන භාවිතය
- අලෙවිකරණය
- කෘෂිකාර්මික ණය
- කෘෂි රක්ෂණය
- ආදායම්
- පරිභෝජනය
- ජනගහනය හා ජීව සංඛ්‍යා

පරිගණකගත කොට නොමැති තවත් තොරතුරු බොහොමයක් ලේඛනගතව පවතී.

දත්ත බැංකුවේ තැන්පත් නොකරන ලද එසේ වුව ද අදාළ වන්නා වූ තොරතුරු, විවිධ ප්‍රකාශන පරිශීලනය කිරීමෙන් දත්ත ඉල්ලුම්කරුවන්ට ලබාදීමට ද දත්ත බැංකුවේ කාර්ය මණ්ඩලය කටයුතු කරනු ලැබේ.

ඉල්ලුම්කරුවන් තමන් හට අවශ්‍යවන්නා වූ ආකෘති යටතේ මුද්‍රිතව ද, තවදුරටත් විශ්ලේෂණ කළ හැකි වන පරිදි ඉලෙක්ට්‍රොනික දත්ත ගොනුවක් ලෙස හෝ ප්‍රස්ථාර ආකාරයෙන් ද දත්ත ලබාදීමට කටයුතු කරනු ලැබේ.

දත්ත විශ්ලේෂණය කිරීමේ කටයුතු ද ඉටු කරනු ලැබේ.

දත්ත බැංකුව පරිහරණය කරන්නන් හට ආයතනයේ කාර්යාල වේලාවන් තුළ දී දත්ත බැංකුව විවෘතව තැබෙන අතර සුළු සේවා ගාස්තුවක් පමණක් ගෙවීමෙන් ඉහත සඳහන් සේවා ලබා ගත හැකිය.

දත්ත බැංකුවේ ඇතුළත් තොරතුරු පමණක් නොව වෙනත් අදාළ තොරතුරු ද සහිතව කෘෂි භෝග විවරණය නමින් ප්‍රකාශන කිහිපයක් කලින් කළ මුද්‍රණය කරන ලද අතර ඒවා ප්‍රකාශන අංශයෙන් මිලට ගත හැකිය.

ඒවා නම්,

- කෘෂි බෝග විවරණය - ප්‍රකාශන අංක 1 - 1998 මැයි
- කෘෂි බෝග විවරණය - ප්‍රකාශන අංක 2 - 2000 නොවැ
- කෘෂි බෝග විවරණය - ප්‍රකාශන අංක 3 - 2001 පෙබරවාරි
- කෘෂි බෝග විවරණය - ප්‍රකාශන අංක 4 - 2007 මාර්තු
- කෘෂිකාර්මික පැතිකඩ 2006/2007

පසුගිය වසර 05 තුළ දී දත්ත බැංකුවේ සේවා ලබා ගැනීමට පැමිණි අය 75% ක් බාහිර ආයතනවලින් ද 25% ක් ආයතනයේ පර්යේෂණ කාර්ය මණ්ඩලයෙන් ද සමන්විත විය. දත්ත සඳහා පැමිණි බාහිර ඉල්ලුම්කරුවන්ගේ ව්‍යාප්තිය පහත සඟහන් පරිදි විය.

| | බාහිර ඉල්ලුම්කරුවන් වර්ගීකරණය | ප්‍රතිශතය % |
|---|---|---|
| i. | විශ්වවිද්‍යාල ආචාර්යවරු, පශ්චාත් උපාධි අපේක්ෂකයින්, ශිෂ්‍යයින් | 35.1 |
| ii. | පෞද්ගලික ආයතන, සමාගම් | 23.4 |
| iii. | රාජ්‍ය දෙපාර්තමේන්තු, ආයතන, අමාත්‍යාංශ | 23.4 |
| iv. | පෞද්ගලික ඉල්ලුම්කරුවන් | 10.6 |
| v. | දේශීය / විදේශීය පර්යේෂකයින් | 3.3 |
| vi. | ප්‍රතිපත්ති සම්පාදකයින් | 1.7 |
| vii. | වගා කරුවන් | 1.7 |
| viii. | බැංකු ක්ෂේත්‍රයේ අය | 1.5 |
| ix. | මාධ්‍යවේදීන් | 1.3 |
| | | 100.00 |

ජේ.එන්. රංජිත් ප්‍රනාන්දු
දත්ත විශ්ලේෂක
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු
පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

*(මෙම ලිපිය සකස් කිරීමේ දී සංඛ්‍යාන හා දත්ත සැකසුම් ඒකකයේ ප්‍රධාන සහ ජ්‍යෙෂ්ඨ වැඩසටහන් විශ්ලේෂක එම්.ඩී.එල් සෙනරත් මහතාගෙන් ලැබුණ සහයෝගය ස්තුති පූර්වකව සඳහන් කරමු - **සංස්කාරක**)*